**ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වනබව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් වූ ප්‍රතිපාදනය රු.900,000 ක් වුවද ඉන් රු.618,335 ක් හෙවත් සියයට 69 ක ඉතිරිවීම් පැවතුණි. | අනුමත ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | වැය විෂයයන්ගේ සියයට 25 ක ප්‍රතිපාදන වියදම් නොකර තබන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් දන්වා තිබූ බවත්, විශේෂිත වූ පුහුණු අවශ්‍යතාවයක් මතු නොවූ බවත් 2019 වර්ෂය තුල නවක නීති නිලධාරීන් බඳවා ගැනීම සිදුනොවීම නිසාත්, ප්‍රතිපාදන ඉතිරිවූ බව දන්වා එවා තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නිරවද්‍ය නොවූ තොරතුරු හා ඒ සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකල යුතුව තිබූ කාර්යයකට අදාල ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණු අතර එම කාර්යය සමාලෝචිත වර්ෂය | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් නියමිත පරිදි ඉටු කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | 2009 අංක 23 දරණ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනන (සංශෝධන) පනතේ කෙටුම්පත් කටයුතු නීති කෙටුම්පත් සම්පාදක විසින් ආරම්භ කර ඇති බවත් 2019 නොවැම්බර් මාසයෙන් පසු නව රජයක් පත්වීම |

| | | | |
|---|---|---|---|
| | අවසන් වනවිටත් නිම කිරීමට නොහැකිව පැවතුණි. | | හේතුවෙන් යළිත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දන්වා ඇති බවත් 2020 පෙබරවාරි සිට 2020 අගොස්තු දක්වා පාර්ලිමේන්තුවක් නොපැවති බැවින් එකී කාලය තුලද එම කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත් ඉදිරියේදී එම අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වා එවා තිබුණි. |
| (ආ) | 2018 වර්ෂයේ සිට පැවත එන පනත් කෙටුම්පත් 05 ක සංශෝධන කටයුතු 2019 දෙසැම්බර් 31 දක්වා නිම කර නොතිබුණි. | -එම- | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සඳහා නව අධ්‍යක්ෂක මණ්ඩලයක් 2019 දෙසැම්බර් මස සිට පත්වූ බැවින් එම නව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වූ බවත්, 2020.10.02 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කල අතර එයට 2020.10.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති බවත්, එකී අනුමැතිය අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත 2020.11.03 දිනැති ලිපිය මගින් දන්වා යවා ඇත. තවද කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බැවින් නව රජයේ ප්‍රතිපත්තිය අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත පනත් 07 කින් සැදුම්ලත්, අමාත්‍යාංශ 04 ක් මගින් ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පතක් වන අතර 2019 නොවැම්බර් මාසයෙන් පසු නව රජයක් පත්වීම හේතුවෙන් යළිත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුවූ බැවින් එම අමාත්‍යාංශ විසින් නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන අප වෙත යොමු කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කළ හැක.<br>ශ්‍රී ලංකා විගණන හා ගිණුම්කරණ ප්‍රමිති පනත් කෙටුම්පත සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2020.09.07 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල |

| | | |
|---|---|---|
| | | කාර්යාලයට යොමු කල බවත් එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ දක්වා ලැබී නොමැත.<br>මුල්‍ය ක්ෂේත්‍ර නියාමකයන්ගේ තොරතුරු හුවමාරුව සඳහා පනත් කෙටුම්පත සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව සංශෝධන යොමු කර ඇති බැවින් එකී සංශෝධනද ඇතුළත් කරමින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරමින් පවති. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත අනුමත සේවක සංඛ්‍යාවෙන් 04 ක් හෙවත් සියයට 21 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු වලින් 02 ක්ම ජ්‍යෙෂ්ඨ මට්ටම් තනතුරු විය. | කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන කාර්යමණ්ඩල පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය | ▪ අධ්‍යක්ෂ ජනරාල් තනතුර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ යුතු තනතුරකි.<br><br>▪ පුරප්පාඩුව පැවති නීති නිලධාරි තනතුරු 02 සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි 2020.01.01 දින නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන ඇත.<br><br>▪ සංවර්ධන නිලධාරි තනතුර සඳහා නීති උපාධිධාරියෙකු අවශ්‍ය වන බැවින් සපයාගැනීමේ දුෂ්කරතාවය මත නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත.<br><br>▪ අමාත්‍ය මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කළ අවස්ථාවකදී පුරප්පාඩුව පවතින රියදුරු තනතුර පිරවීමට කටයුතු කරනු ලැබේ.<br><br>▪ ඒ අනුව, මේ වන විට අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින සමස්ත පුරප්පාඩු ගණන 04ක් වන අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02ක් පමණක් පුරප්පාඩුව පවති. |